# ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය ප්‍රවර්ධනය කිරීම උදෙසා යොදාගත හැකි නව ප්‍රවණතා

ආර්.ඒ.අයි. ගවේශනා[1]

ශිෂ්ට සමාජයක කැඩපත වශයෙන් ලෝකය ඉදිරියේ ලාංකේය අභිමානය නිරූපණය කරන්නා වූ ආයතනයක් වශයෙන් කොළඹ ජාතික කෞතුකාගාරය නම් දරණු ලැබේ. මහජන තෘප්තිය සපුරාලීමට මෙන්ම දෙස් විදෙස් ආකර්ෂණය ලබාගැනීමට, ජාතික උරුමය තැම්පත්කර ඇති උරුම කළමනාකරණ ආයතනයක් වශයෙන් ජාතික කෞතුකාගාරය සමාජගත කිරීමෙහිලා ප්‍රයත්න දැරීම කෞතුකාගාර ප්‍රවර්ධනය නම් වේ. කොළඹ ජාතික කෞතුකාගාරය තුළ වර්තමානයේ පවතින කෞතුකාගාර ප්‍රවර්ධන වැඩ පිළිවෙලෙහි පවතින්නා වූ දුර්වලතා හඳුනාගනිමින් යාවත්කාලිනව එම ප්‍රවර්ධන වැඩ පිළිවෙලට අනියුක්තකර හැකි නව ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. පුස්තකාල අධ්‍යයනය, අන්තර්ජාල පරිශීලනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් මෙම පර්යේෂණයට දත්ත රැස්කරන ලදී. මූලික ප්‍රවර්ධන මූලධර්ම හතරක් සහ සෙසු මූලධර්ම තුනක් යටතේ ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය ප්‍රවර්ධනය කිරීමට ප්‍රයත්න දැරීම තත්කාලීන සමාජ පසුබිමට යෝග්‍ය වන්නේය. එහි දී කෞතුකාගාරයක පදනම වන කෞතුක භාණ්ඩ එකතුව වැඩි දියුණු කිරීම මෙන්ම නිතිපතා නව ක්‍රමවේදයන් යටතේ එම  භාණ්ඩ විවිධ තේමාවන් ඔස්සේ වර්ගීකරණය කිරීම හා පිළියෙල කිරීම, ජංගම කෞතුකාගාර පවත්වාගෙන යාම, දෙස් විදෙස් සම්මන්ත්‍රණ, අධ්‍යාපනික වැඩසටහන් හා විවිධ තරඟ මාලාවන් පැවැත්වීම වැනි නව ක්‍රමෝපායන් මගින් වර්තමාන ජාතික කෞතුකාගාරය ප්‍රවර්ධනය කිරීම යෝග්‍ය වේ. එපමණක් ද නොව මූලික මහජන අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන්ට උචිත පහසුකම් හා සෙසු මූලික පහසුකම් සැලසීම ද මෙහි දී ඉතා වැදගත් වේ. එහි දී විවිධාකාර මානව චර්යාවන්ට අනුගත වන පරිදි ළමා, තරුණ, වයස්ගත, හා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් වැනි ඕනෑම මට්ටමක පුද්ගල විවිධතා හඳුනාගෙන ඔවුන්ගේ තෘප්තිය කෞතුකාගාරය කෙරෙහි ඇතිකරගැනීම මෙම ප්‍රවර්ධන වැඩ  පිළිවෙලෙහි මූලික පරමාර්ථය ලෙස අවධාරණය කරගත යුතුය. භාණ්ඩ, සමරුපළක, සීඩී පට හා ග්‍රන්ථ අලවිකරණයෙන් ජාතික කෞතුකාගාරය ප්‍රවර්ධනයට අවශ්‍ය වන්නා වූ මුදල් ප්‍රතිපාදන කෞතුකාගාර ප්‍රවර්ධන වැඩපිළිවෙල තුළින්ම උපයා ගැනීම වඩා උචිතය. ලොව විවිධ රටවල් අතර කොළඹ ජාතික කෞතුකාගාරය ප්‍රචලිත කිරීමෙහිලා වර්තමානය වන විට භාවිත නොවන්නා වූ සංචාර සැලසුම් ක්‍රම ඇති කිරීම, ශ්‍රව්‍ය මාර්ගෝපදේශ ක්‍රමෝපායන් භාවිත කිරීම, වෙබ් අඩවි යාවත්කාලින කිරීම හා ප්‍රයෝගික අත්හදා බැලීම් ඇති කිරීම වැනි විවිධාකාර වූ ක්ෂේත්‍ර ඔස්සේ කෞතුකාගාරය ප්‍රවර්ධනය කිරීම තුළින් විස්තෘත ලෝකය තුළ දේශීය අනන්‍යතාවය පැතිරවීමට හැකිය. මහජන ආකර්ෂණය හා උනන්දුව සංතෘප්ත කරගැනීම උදෙසා යොදා ගන්නා වූ මෙවැනි විවිධාකාර කෞතුකාගාර ප්‍රවර්ධන නව ප්‍රවණතා මගින් රටක උරුමය මතු පරම්පරාවට නිරායාසයෙන්ම දායාද වීම සිදුවනවා සේම එමගින් ජාතික අනන්‍යතාවය සමාජගත වීම ද සිදු වන්නේය.

**ප්‍රමුඛ පද** : කෞතුකාගාර ප්‍රවර්ධනය, කෞතුක භාණ්ඩ, නව ප්‍රවණතා, ප්‍රවර්ධන මූලධර්ම

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.*aigranasinghe@gmail.com*